# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1791/15 - 2013 ජනවාරි මස 01 වැනි අඟහරුවාදා - 2013.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය)**

**විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය**

විනිමය පාලන පනතේ 3 සහ 48 වන වගන්ති සමග කියවෙන 5 සහ 7 වන වගන්ති වලට අනුව විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමකට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගෙන් ණය ලබා ගැනීම සඳහා මෙයින් අවසර ප්‍රදානය කරනු ලැබේ.

1. 2007 අංක 07 දරන සමාගම් පනතින් අර්ථ දැක්වෙන ඇපයෙන් සීමිත සහ අක්වෙරළ සමාගම් සඳහා මෙම අනුමැතිය අදාළ නොවේ.

2. විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය 2013.01.01 දින ආරම්භ වී 2015.12.31 දිනෙන් අවසන් වේ.

3. සමාගමකට මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා ගත හැකි උපරිම ණය මුදල එක්සත් ජනපද ඩොලර් මිලියන 30 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන වටිනාකමක් විය යුතු ය. එසේ වුවද, සමාගමකට ලිත් වර්ෂයකට ලබා ගත හැකි උපරිම ණය මුදල එක්සත් ජනපද ඩොලර් මිලියන 10 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන වටිනාකමක් විය යුතු ය.

4. කිසියම් සමාගමකට මෙහි සඳහන් සීමාවන් ඉක්මවා ණය ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා විනිමය පාලකගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

01 - 469


1A - G 017079 — 355 (2013/01)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.